Fungal - ආසාදනය



# Tinea
# (Ringworm & Athlete's Foot)

## වැදගත් කරුණු

**Ringworm**

- ළමයෙකුගෙන් ළමයෙකුටත් සුරතල් සතෙකුගෙන් ළමයෙකුටත් බෝවිය හැක.
- **Antifungal** නම් ක්‍රීම් වර්ගයෙනුත් බෙත් පෙති වලිනුත් ප්‍රතිකාර කළ හැක.

**Athlete’s Foot**

- නෑමෙන් පසු පාමුල තරයේ වියලි කරන්න
- පාමුල වියලි බව සහ තෙමනය රැඳී තිබීම වළක්වන්න
- **Sneakers/Runners** පැළඳ තබා ගැනීමේ කාලය අඩු කරන්න
- ක්‍රීඩා වලින් පසුව තෙතමනය ඇති මේස් සහ පාවහන් මාරු කරන්න
- කපු හෝ ලොම් මේස් පළඳින්න
- පාද උෂ්ණවත් නොවන සහ දාඩිය නොදමන සැන්ඩල්ස් හෝ පාවහන් වර්ග පළඳින්න

## ඒවා මොනවාද?

Tinea, ෆන්ගසයක් නිසා සමේ ඇතිවන පොදු ආසාදනයකි. හිසේ සමේ (Scalp) සහ ශරීරයේ ඇතිවන tinea වලට ringworm යයි කියනු ලැබේ. පාමුල ඇතිවන tinea, athlete’s foot නමින් හඳුන්වනු ලැබේ. වයස අවුරුදු දෙකෙන් පහල ළමුන් අතර බෙහෙවින්ම පොදු දෙයකි.

## එය හට ගන්නේ කොහේද?

හිසේ සමේ (Scalp) ය.  හිස කෙස් වැටී පතුරු ගැසී ඇති කුඩා කැබෙල්ලක tinea ඇතිවිය හැක. පිටතින් රතු පරිමාණයේ වලල්ලක පැහැදිලි මැදක් ඇතිව ringworm වශයෙන් ශරීරයේ දක්නට ලැබේ. ස්වභාවික පාට ඇති සමේ මෙය රතු පාටට වඩා දම් පාට හෝ දුඹුරු පාටින් විය හැක. පාද වලදී එය කැසීම හට ගන්නා අතර ඇඟිලි පුරුක අතර පැලීම හෝ යටිපතුලේ පරිමාණයක රතු හෝ දුඹුරු පාට වෙනස්වීමක් සහිතව දැක්වේ. නියපොතු වල tiena සෑදීමේදී නියපොත්තේ කහ හෝ සුදු පාට වෙනස් කිරීමක් හටගනී. නියපොත්ත කෙලවර ඉස්සී ඇතුලත සිවියක් සෑදේ.

## ඒවා ඇති වන්නේ කෙසේද?

Tinea ෆන්ගසයක් නිසා ඇතිවන ආසාදනයකි. මෙම ෆන්ගසය එක් ළමයකුගෙන් තවකෙනෙකුට බෝවිය හැක. එය විශේෂයෙන්ම ශරීරයේ හෝ කෙස් සහිත හිසේ සමේ ඇතිවන සම්භාව්‍ය ringworm වර්ගයට අයත් ෆන්ගසයන්ය. මෙම වර්ගයේ tinea පූස් පැටියන්ගෙන් හෝ බලු පැටියන්ගෙන් බෝවිය හැක. පාද වල tinea ඇති කරණ  වෙනම ෆන්ගසයක් තිබේ. මෙය නිරන්තරයෙන්ම නාන බාල්දි, පීනුම් තඨාක හෝ වෙනත් ප්‍රජා නෑමේ පහසු කම් සළසා ඇති ස්ථාන ඇතුලත සහ අවට ඇත. කුඩා දරුවන් නිවසේදී tinea ඇති දෙමාපියන්ගෙන් හෝ සහෝදර සහෝදරියන් ගෙන් බෝ කර ගත හැක.

Sneakers/Runners වැනි පාවහන් උෂ්ණත්වය සහ තෙතමනය ඇති කිරීම නිසා tinea ඇති කරවීමට බෙහෙවින් හිතකරය. පයේ නියපොතු වල tinea පාදයේ tinea හා කැටුව පවතී.

## ඒවා වලක්වා ගැනීම සහ ප්‍රථිකාර කෙසේද?

### Ringworm

වෛද්‍ය වරයකු විසින් නියම කරණු ලබන antifungal antibiotics වලින් හිසේ සමේ හෝ ශරීරයේ ඇතිවන tinea වලට ප්‍රථිකාර කරණු ලැබේ. ඖෂධ වේදියකුගෙන් ලබා ගන්නා antifungal ක්‍රීම් වර්ගද පාවිච්චි කළ හැක. ඔබේ දරුවාට ringworm වැළඳී ඇත්නම් පුස් පැටියන් සහ බලු පැටියන් පශු වෛද්‍ය වරයකු ලවා පරීක්ෂා කර ගන්න.

### Athlete’s Foot

සාමාන්‍යයෙන් පාදවල ඇතිවන tinea ඖෂධ වේදියකුගෙන් ලබා ගන්නා antifungal ක්‍රීම් සහ ලෝශන් වලින් සුව වේ.නෑමෙන් පසු හෝ පිහිනීමෙන් පසුව පයේ ඇඟිලි අතර සැළකිල්ලෙන් වියලි කිරීමෙන් ආසාදනය වළක්වා ගත හැක.

Sneakers/Runners පැළඳ තබා ගැනීමේ කාලය අඩු කරන්න. පාදවල tinea ආසාදනය වැඩි කරවන උෂ්ණ තෙතමන අවදානම අඩු කර ගැනීමට කපු හෝ ලොම් වලින් තැනූ උරා ගන්නා මේස් ඉතා අගනේය. වෛද්‍ය වරයකු නියම කරණ විශේෂ antifungal පෙති නියපොතු වල tinea ප්‍රථිකාරයට අවශ්‍යය.

## වැඩිපුර තොරතුරු

ඔබේ මාතෘ සහ ළමා සෞඛ්‍ය හෙදිය

ඔබේ ඖෂධ වේදියා

ඔබේ පවුලේ දොස්තර මයා/මිය

චර්ම රෝග විශේෂඥයෙක් (A dermatologist)

© 2002, Department of Dermatology, St. Vincent’s Hospital Melbourne, Victoria Parade, Fitzroy, Victoria 3065 Australia.